# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | එන්සී/ඒපී/ර/2011/16 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2011 සැප්තැම්බර් |

උපකුලපති,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (1) සහ 111 වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4), (7) උප වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන්වේ

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම.

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන.

---

2.1 මතය.

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.2.1 ගිණුම්කරණ ප්‍රමිත

සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු.167,142,573 ක් වූ ස්ථාවර වත්කම් වර්ග 15 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට අනුව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අත්හැරීම්

විශ්වවිද්‍යාලය ආරම්භ කරන අවස්ථාවේ විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබුණු ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ලේ නඩත්තු අංශ ගොඩනැගිල්ල, නිල නිවාස 33 ක් සහ එහි ඉඩම සමාලෝචිත වර්ෂයේදීද පවරාගෙන නොතිබීම හේතුවෙන් ඒවායේ වටිනාකම වර්ෂ 11 ක කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වී නොතිබුණි.

(ආ) අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම්.

අනුරාධපුර රෝහලට අයත් ඉඩමක් රජරට විශ්වවිද්‍යාලයට පවරා ගැනීම වෙනුවෙන් ගෙවීමට ඇති වටිනාකම වන රු.10,000,000 ක මුදල වත්කම් ගිණුමට හර කර ණය හිමි ගිණුමට බැර කළ යුතු වුවද, එය අතරැඳවුම් තැන්පත් ගිණුමට බැරකිරීම මත එම ගිණුම රු.10,000,000 ක් වැඩියෙන් දැක්වුණි.

### 2.2.3 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දින මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රභවයේදී රඳවාගත් බද්ද (WHT) රු.918,960 ක වටිනාකමක් වූ අතර, ලෙජරය හා උපලේඛන අනුව රු.870,019 ක් වූයෙන් රු.48,941 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මහපොළ භාරකාර අරමුදල වෙත ආපසු ගෙවිය යුතු මුදල රු.2,397,534 ක් ලෙස ලෙජර් ගිණුමේ දැක්වුවද, අදාළ උපලේඛන අනුව එම මුදල රු.2,450,823 ක් වූයෙන් රු.53,290 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා ස්ථානමාරු ලැබූ සේවකයන් 35 දෙනෙකුගෙන් විවිධ ණය අත්තිකාරම් යටතේ අයවිය යුතු එකතුව රු.668,154 ක් වූ ණය ශේෂයක් වසර 01 ක හා 03 කට අධික කාලයක සිට අය නොවී පැවතුණි.

(ආ) එකතුව රු.84,868,569 ක් වූ විවිධ ණය හිමියන්ගේ ශේෂ සනාථ කිරීම් සහ වයස් විශ්ලේෂණ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලවේ (PGDM) විවිධ කාර්යයන් සඳහා අවස්ථා 25 කදී රු.8,000 ක සිට රු.100,000 දක්වා වටිනාකම්වලින් යුතුව ලබා දී තිබුණු එකතුව රු.1,304,300 ක් වූ අත්තිකාරම් ගිණුම් වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි.

(ඈ) පුද්ගලයන් 04 දෙනෙකුට අවස්ථා 04 කදී පර්යේෂණ අත්තිකාරම් ලෙස ලබා දී තිබුණු එකතුව රු.305,000 ක් වූ මුදලක් මාස 13 සිට 25 අතර කාලයක් ඉක්මවා තිබුණද පියවා නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා ආදී විගණන සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.1,512,654,773 ක් වූ ස්ථාවර වත්කම්ද, විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවීම නිසා කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ (PGOM) අත්තිකාරම් රු.1,424,300 හර ශේෂයද, විස්තරාත්මක උපලේඛන සහ අදාල ජර්නල් සටහන් ඉදිරිපත් නොකිරීම නිසා එම පාඨමාලාවේම 23701 ලෙජර් ගිණුමට අදාලව රු.308,029 ක බැර ශේෂයක්ද විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ක්‍රියාත්මක ආයතන සංග්‍රහයේ XXIV පරිච්ජේදයේ 2.1 සිට 2.1.4 දක්වා උප වගන්ති | 2010 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ පැවති ස්ථාවර වත්කම් සමීක්ෂණය කර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

---

| | |
|---|---|
| (i) XIX පරිච්ඡේදයේ 5 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දී රු.510,000 ක් ගෙවා බද්දට ගෙන තිබුණු නිවාස දෙකක පදිංචි වී සිටි නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි නිවාස කුලී අයකරගෙන නොතිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය | I. නිල නිවාසවල පදිංචි නිලධාරීන් පෞද්ගලික ජල හා විදුලි පරිහරණය වෙනුවෙන් ජල හා විදුලි ගාස්තු ගෙවිය යුතු වුවද, රජරට විශ්වවිද්‍යාලයේ නිලධාරීන් පදිංචි නිවාස දෙකක ජල පරිහරණය වෙනුවෙන් පිළිවෙලින් රු.18,698 ක් සහ රු.5,590 ක් ද විදුලි ගාස්තු වශයෙන් පිළිවෙලින් රු.32,124 ක් සහ රු.14,022 ක් ද සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබුණි.<br><br>II. රජරට විශ්වවිද්‍යාලයේ රඹෑව හා මිහින්තලේ පරිශ්‍රයේ පිහිටි පවුල් ඒකක නිවාස 55 ක සත්‍ය ජල බිල් ගාස්තුව රු.869,128 ක් වුවද, ඒ සඳහා පදිංචි සේවකයින්ගෙන් රු.65,520 ක මුදලක් පමණක් අයකර තිබීම හේතුවෙන් පෞද්ගලික පරිහරණය සඳහා යොදාගත් ජල ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.803,608 ක අමතර මුදලක් විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---

| | |
|---|---|
| (i) මු.රෙ 395 (අ) | එක් එක් මාසය අවසානයේදී තම ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙළ කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාලව බැංකු ගිණුම් 03 ක සැසඳුම් ප්‍රකාශ 16 ක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) මු.රෙ 880 | වවුචර් පත් සහතික කරන, චෙක්පත් අත්සන් කරන නිලධාරීන් ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2002 අප්‍රේල් 16 දින හා අංක 147/2002 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 1 ඡේදය | 1996 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයේ දී මසකට රු.38 සිට රු.450 දක්වා කුලී ප්‍රමාණයක් අයකර තිබුණු විශ්වවිද්‍යාලය සතු පවුල් ඒකක නිවාස 19 ක හා තනි ඒකක නිවාස 55 ක නිවාස කුලී නැවත තක්සේරු කර අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 හා 2009 ජූනි 17 දිනැති 9/2009 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර භාවිතා කළ යුතු වුවද, රජරට විශ්වවිද්‍යාලයේ මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොතිබුණි. |

2.2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනු දෙනු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බීඩී/අයි/එන්එස්/ඩීඩබ්ලියු/එස්/ඒ 078 හා 2003 ජූලි 18 දිනැති ලිපියෙන් විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේ දී අධ්‍යයන දීමනාව හා මාසික හිලව් දීමනාව ඇතුළත් නොවන බව දන්වා තිබුණු නමුත්, අදාල දීමනා සැලකිල්ලට ගැනීමේ හේතුවෙන් 1998 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.11,477,553 ක මුදලක්ද, සමාලෝචිත වර්ෂයේ දී රු.1,174,591 ක මුදලක්ද විධිමත් අධිකාර් බලයක් නොමැතිව අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ දායක මුදල් ගෙවීම සඳහා වැය කර තිබුණි.

(ආ) භාෂා ප්‍රවීණතාවය සඳහා රජයේ නිලධාරීන්ට ගෙවනු ලබන දීමනාව රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට දීර්ඝකර නොමැති බව රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඊ/01/174/11(බී) හා 1998 මාර්තු 06 දිනැති ලිපියෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා තිබුණු නමුත්, 1999 වර්ෂයේ සිට 2009 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා එකතුව රු.3,520,447 ක මුදලක් ද, සමාලෝචිත වර්ෂයේ දී රු.298,821 ක මුදලක්ද භාෂා ප්‍රවීණතා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) නේවාසිකාගාර සඳහා මිහින්තලේ විශ්වවිද්‍යාල භූමියේ පිහිටි පොලිස් නිවාස පවරා ගැනීම වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් 2006 වර්ෂයේදී රුපියල් මිලියන 18 ක මුදලක් ලබා දී තිබුණු නමුත්, එම පවරා ගැනීම 2010 දෙසැම්බර් 31 වන විටත් සිදු වී නොතිබුණි. ලංකා බැංකුවේ තැන්පත් කර තිබුණු මෙම රුපියල් මිලියන 18 ක් සහ ඒ සඳහා ලැබී තිබුණු පොලිය වන රු.8,423,653 ක මුදල 2010 මාර්තු 02 දින භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලය විසින් ආපසු ලබා ගෙන අරමුණින් බැහැරව විශ්වවිද්‍යාලයේ වෙනත් වියදම් සඳහා යොදවා තිබුණි. 2010 දෙසැම්බර් 31 දින පොලිය හැර මිලියන 18 ක මුදල පමණක් නැවතත් ලංකා බැංකුවේ තැන්පත් කර තිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වලින් රු.173,100,494 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.117,596,632 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.55,503,862 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

#### 3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබී තිබුණු මුදලින් වියදම් දැරීමෙන් පසුව ඌනතාවය රු.80,503,790 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.42,293,305 ක් විය. තවද සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරින ලද රු.99,084,694 ක් වූ ස්ථාවර වත්කම් ක්ෂය සඳහා ප්‍රතිපාදනය හා රු.3,685,440 ක් වූ පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය සැලකිල්ලට ගත් කල මෙම ඌනතාවය රු.183,273,924 ක් දක්වා වැඩිවන අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන රු.86,141,682 ක්ද, පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.2,641,143 ක්ද සැලකිල්ලට ගැනීමේදී ඌනතාවය රු.131,076,129 දක්වා වැඩිවී තිබුණි. එහෙත් මෙම ඉහත තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශන වලින් හෙලිදරව් වී නොතිබුණි. පුනරාවර්තන වියදම් සඳහා විශ්වවිද්‍යාල කොමිෂන් සභාවෙන් ලැබී තිබුණු මුදලට අමතරව විශ්වවිද්‍යාලයේ වෙනත් ආදායම් සැලකිල්ලට ගත්කල මූල්‍ය ප්‍රකාශන වලින් දක්වා තිබුණු සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ ඌනතාවයන් පිලිවෙලින් රු.173,100,494 ක් සහ රු.117,596,632 ක් විය.

#### 3.1.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් කිසිදු නීතිමය අයිතියක් නොමැති මාතලේ රෝහලේ විවේකාගාරයක් සහ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,350,981 ක් වැය කර එය පුනරාවර්ථන වියදමක් සේ සළකා ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත සඳහන් පරිදි වේ.

(අ) 2010 වර්ෂයේදී පැවැත්වූ අවසන් වසර විභාගය හා උපාධිය සමත්වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | කෘෂිකර්ම පීඨය | කළමනාකරණ පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අවසන් වසර විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 52 | 156 | 88 | 208 |
| විභාගය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 39 | 136 | 65 | ප්‍රතිඵල නිකුත් කර නොමැත |
| විභාගය අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 13 | 20 | 12<br>11* | |
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් උපාධිය අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය | 25% | 13% | 14% | |

* ව්‍යවහාරික විද්‍යාපීඨයේ විභාගය අසමත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් එකොළොස් දෙනෙක් විශේෂ පාඨමාලාවක් සඳහා තෝරාගෙන තිබුණි.

සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ අවසන් වසර විභාගය 2010 සැප්තැම්බර් 18 දින සිට 2010 නොවැම්බර් 12 දින දක්වා පවත්වා තිබුණු අතර, විගණන වාර්තාවේ දිනය වන විටද ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක කාලපරිච්ඡේදය තුල විශ්වවිද්‍යාලයේ ඇති පීඨ 05 සඳහා බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව හා උපාධි ලබා පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

| පීඨයේ නම | බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | උපාධි ලබා පිටවූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
| වෛද්‍ය පීඨය | 171 | 180 | 181 | 184 | 180 | - | - | - | - | - |
| කෘෂිකර්ම පීඨය | 74 | 113 | 107 | 108 | 95 | 12 | 28 | 54 | 91 | 55 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 95 | 160 | 216 | 173 | 196 | 40 | 91 | 89 | 92 | 69 |
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 156 | 225 | 275 | 337 | 330 | 119 | 192 | 154 | 114 | 181 |
| කළමනාකරණ පීඨය | 220 | 211 | 279 | 307 | 276 | 88 | 21 | 162 | 201 | 163 |
| එකතුව | 716 | 889 | 1058 | 1109 | 1077 | 259 | 332 | 459 | 498 | 468 |

2006 වර්ෂයේදී ආරම්භ කරන ලද වෛද්‍ය පීඨයේ සිසුන් උපාධි ලබා පිටවීම 2011 දී සිදුවේ. අනෙකුත් පීඨවල එක් එක් වර්ෂයේ බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සාමාන්‍ය සහ විශේෂ උපාධි ලබා පිටවීම පිලිබඳව පැහැදිලිව දත්ත ලබා ගැනීමට හැකිවන ලෙස එක් එක් පීඨවල සහ විභාග හා අධ්‍යයන අංශයේ තොරතුරු නොවීය.

(ඇ) ඒක ශිෂ්‍ය පිරිවැය

විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයේ මුළු පිරිවැය හා ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | කෘෂිකර්ම පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | කළමනාකරණ පීඨය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු. '000) | 73,098 | 91,604 | 97,391 | 97,056 | 112,994 | 472,143 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 497 | 840 | 1,323 | 1,293 | 896 | 4,849 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු. '000) | 147 | 109 | 74 | 75 | 126 | 97 |

(ඇ) 2010 වර්ෂයේ දේශන පැවැත්වීමේ ප්‍රගතිය පහත සඳහන් පරිදි විය.

| | පීඨය | සැළසුම්ගත දේශන පැය | පැවැත්වූ දේශන පැය | පවත්වා නොතිබුණු දේශන පැය |
|---|---|---|---|---|
| (i) | ව්‍යවහාරික විද්‍යා පීඨය | 7595 | 7563 | 32 |
| (ii) | කෘෂිකර්ම පීඨය | 5246 | 4471 * ක්ෂේත්‍ර චාරිකා සඳහා කාලය ඇතුළත් කර නොමැත | 775 |
| (iii) | මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය | 7020 | 6669 | 351 |
| (iv) | සමාජ විද්‍යා අධ්‍යනාංශය | 7400 | 7189 | 211 |
| (v) | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | 2064 | 2064 | - |
| (vi) | කළමනාකරණ අධ්‍යාපන පීඨය | 10560 | 10376 | 184 |
| | | 39885 | 38332 | 1553 |

2010 වර්ෂය සඳහා සැළසුම්කළ දේශන පැය ගණන 39885 ක් වූ අතර, පැවැත් වූ දේශන පැය 38332 ක් වූයෙන් සැළසුම්කළ ප්‍රමාණයෙන් 4% වූ දේශන පැය 1553 ක් පවත්වා නොතිබුණි.

### 3.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේදී රු.206,000,000 ක මුදලකට ඇස්තමේන්තු පිලියෙල කර මිළ ගණන් කැඳවා ඉදිකිරීමට යෝජිතව තිබුණු සමාජ විද්‍යා මානව ශාස්ත්‍ර පීඨයේ යෝජිත ගොඩනැගිල්ල සඳහා 2007 හා 2008 වර්ෂවලදී උපදේශක දීමනා සහ පරිපාලන ගාස්තු ලෙස රු.1,213,135 ක මුදලක් ද, සමාලෝචිත වර්ෂයේදී ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමේ මුද්‍රණ ගාස්තු හා සැළසුම් ඇඳීමේ ගාස්තු වශයෙන් රු.129,416 ක මුදලක්ද වැය කර තිබුණි. නමුත් වසර 03 කට වැඩි කාලයක් ගතවී ඇතත් කිසිදු ඉදිකිරීමක් කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදි වැඩ ආරම්භ කර තිබුණු ඇස්තමේන්තුගත මුදල රු.6,794,191 ක් වූ දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ කාලය 2009 අප්‍රේල් 10 දක්වා දීර්ඝ කර තිබුණු අතර, එම වර්ෂයේදී රු.1,016,768 ක වියදම් දරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

3.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සමාලෝචිත වර්ෂයේ මුදල් පොතට අනුව අවස්ථා 11 ක දී බැංකු ගිණුම් 03 ක ඍණ ශේෂයන් දක්වා තිබුණි. "එක් එක් බැංකු ගිණුමේ මුදල් ඌනතාවයන් ඇති වූ අවස්ථාවල විශ්වවිද්‍යාලයේ අනෙකුත් බැංකු ගිණුම් වලින් මාරු කිරීමේ බලය බැංකුවට ලබා දී ඇති බව" උපකුලපතිවරයාගේ පිළිතුරින් දක්වා තිබුණි. මේ අනුව කළමනාකරණය මුදල් පාලනය පිළිබඳව තම වගකීම් නොසලකා හැර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2010 වර්ෂයේ දේශන සඳහා වාහනවලින් පැමිණීම වෙනුවෙන් බාහිර කථිකාචාර්යවරුන් වෙත ගමන් වියදම් දීමනා වශයෙන් වවුචර් 31 ක් මගින් දින 89 ක් සඳහා රු.212,844 ක මුදලක් ගෙවා තිබුණු නමුත් කථිකාචාර්යවරුන් තම වාහන වලින් පැමිණි බවට සනාථකර ගැනීමකින් තොරව මෙම ගෙවීම් කර තිබුණි.

3.2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.127,800 ක වටිනාකමැති බැංකු ජංගම ගිණුම් 02 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) පිරිවැය රු.2,107,871 ක් වූ විවිධ වත්කම් තොගයක් හා මිළ පිළිබඳ වාර්තා ගතවී නැති යතුරු ලියනයක්, පරිගණක 03 ක් හා Projectors 06 ක් අබලි තත්ත්වයට පත්ව ගබඩාවේ ගොඩ ගසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී සුදුසු පරිදි ගිණුම්වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) රු.163,875 ක් වටිනාකමැති වේලා සටහන් යන්ත්‍ර 03 ක් ප්‍රයෝජනයට නොගෙන වසර 05 ට අධික කාළයක සිට නිෂ්ක්‍රීයව පවතී.

3.2.5 හානි හා පාඩු

සේවක භාරකාර අරමුදල් ගෙවීමේ ප්‍රමාදයන් හේතුවෙන් රු.14,064 ක මුදලක් අධිභාර වශයෙන් සේවක භාරකාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවා තිබුණි.

3.2.6 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහාචාර්ය තනතුරු 24 ක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 31 ක් සහ ආධුනික කථිකාචාර්ය/කථිකාචාර්ය තනතුරු 55 ක් වශයෙන් එකතුව තනතුරු 110 ක් ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විධායක තනතුරු 07 ක්, විධායක නොවන තනතුරු 32 ක් සහ සුළු සේවක තනතුරු 16 ක් වශයෙන් එකතුව තනතුරු 55 ක් ද පුරප්පාඩුව පැවතුණි.

2. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය.
(ආ) ගබඩා පාලනය.
(ඇ) ස්ථාවර වත්කම් .

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
=லங்கா ரஜரட பல்கலைக்கழகம்
Rajarata University of Sri Lanka

මිහින්තලේ
மிகிந்தலை
Mihintale

ශ්‍රී ලංකා
=லங்கா
Sri Lanka

දුරකථන (පොදු) தொலைபேசி Telephone(General): 025-2266643, 2266645, 2266646, 2266650, ෆැක්ස් பேக்ஸ் Fax: 025-2266511, 2266512
උපකුලපති Vice Chancellor: 025-2266512, ලේඛකාධිකාරී Registrar: 025-2266511, නි. ලේඛකාධිකාරී Deputy Registrar: 025-2266782, ප්‍රසාදකාරී Bursar: 025-2266749

14 DEC 2011
මිහින්තලේ.

මගේ අංකය- RJT/BK/AQ/2010
2011.10.17

පැමිණීම් අංශය
24 NOV 2011
රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.

RAJARATA UNIVERSITY MIHINTALE
18 OCT 2011
REGISTRAR'S OFFICE

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

මහත්මයාණෙනි

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව හා සම්බන්ධ විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම සහ ගෙන ඇති ක්‍රියා මාර්ග**

ඔබගේ අංක එන්සී/ඒපී/ඒ/2011/16 සහ 2011 සැප්තැම්බර් 06 දිනැති විගණකාධිපති වාර්තාව සම්බන්ධව විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම්, ගෙන ඇති ක්‍රියාමාර්ග හා පැහැදිලි කිරීම් විගණන වාර්තාවේ අංක පිළිවෙල අනුව මේ සමග ඉදිරිපත් කරනු ලැබේ.

ස්තුතියි

මහාචාර්ය කේ. ඒ. නන්දසේන
උපකුලපති

**මහාචාර්ය කේ.ඒ. නන්දසේන**
**උපකුලපති**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**
**මිහින්තලේ.**

පිටපත - 1. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
2. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

DB
P.A
3.2.4
20/11
13/12/2011

Letter head/cash transfer

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව විගණනකාධිපති වාර්තාව හා සම්බන්ධ විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම හා ගෙන ඇති ක්‍රියා මාර්ග**

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106 (2) හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 107 (13) 7(A) වගන්තිය ප්‍රකාර රජරට විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික ගිණුම් වාර්ථා 2011 පෙබරවාරි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්ෂික ගිණුම් වාර්තාව සඳහා වූ විගණකාධිපති වාර්තාව 2011 සැප්තැම්පර් 06 දින ලැබී ඇති අතර ඒ සඳහා විශ්වවිද්‍යාලයේ අදහස් පැහැදිලි කිරීම හා අද දිනට ගෙන ඇති ක්‍රියාමාර්ග විගණන වාර්තාවේ අංක පිළිවෙල අනුව මේ සමග ඉදිරිපත් කරනු ලැබේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රමිත

සම්පූර්ණයෙන් ක්ෂය ප්‍රතිපාදනය කර අවසන් වූ ශේෂ පත්‍රයේ ශුන්‍ය අගයන් ගන්නා ස්ථාවර වත්කම් වල අගය ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 18 අනුව ප්‍රත්‍යාගණනය කර පොත් වලට ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා දැනටමත් ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීම සඳහා වූ පරිගණක ජාලයක් ලබාගෙන ඇති අතර. ලේඛන ගත කිරීමට අවශ්‍ය දත්ත සම්පූර්ණයෙන් ලබා ගෙන ඇත. වත්කම් අගය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට බාර දී එම තක්සේරු කිරීමේ කටයුතු ද අවසන් වෙමින් පවතී.

මේ අනුව ස්ථාවර වත්කම් ලේඛන 2011 වර්ෂයේ ගිණුම් සමග ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේ. දැනටමත් පොත් වල ශුන්‍ය අගයක් ගන්නා ස්ථාවර වත්කම් වල අගය තක්සේරු කර අවසන් කර ඇත.

### 2.2.2 ගණකාධිකරණ අඩුපාඩු

(අ) අත්හැරීම්

විශ්වවිද්‍යාලය ආරම්භ කරන අවස්ථාවේ දී විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමට ලබා දී තිබූ පරිපාලන ගොඩනැගිල්ල. නඩත්තු අංශ ගොඩනැගිල්ල. නිල නිවාස සහ එහි ඉඩම් විශ්වවිද්‍යාලයට පවරාගැනීමේ කටයුතු නිම වෙමින් පවතී. නිම වූ පසු එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ.

(ආ) අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම.

රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා සායනික ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් භූමි භාගයක් ලබා ගැනීම වර්ෂ ගණනාවක් තුල ගැටළුකාරී තත්වයක්ව පැවතුනි. එහෙත් පසුව අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂක සමග ඇති වූ එකගතාවය මත එම රෝහලට අයත් භූමිභාගයක ගොඩනැගිලි ඉදිකිරීම සඳහා එකග කරවා ගන්නා ලදි. ඒ සඳහා එම භූමිභාගයේ තිබූ පැරණි ගොඩනැගිලි ඉවත් කිරීම වෙනුවෙන් ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂක සමග එකග වූ පරිදි රු 10,000,000/= ක් ඒ සඳහා විශ්වවිද්‍යාලයෙන් ලබා දීමට එකග විය. මේ සඳහා විශ්වවිද්‍යාලීය පාලක සභාවේ එකගත්වය ලැබූ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ද අනුමැතිය ලැබී තිබුණි. එහෙත්, 2009 වර්ෂය තුල භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා ගැනීමේ දුෂ්කරතාවය මත ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස එකග වූ මුදල ගෙවීම සඳහා ද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබුණි. 2010 වර්ෂයේ ද මේ සඳහා ප්‍රතිපාදන ලබාගත නොහැකි විය. ඒ අනුව ගෙවීමට එකග වූ මුදල නොගෙවා. තැන්පත් ගිණුමක රඳවා තැබීමට කටයුතු කරන ලදි. කෙසේ නමුත් විගණන වාර්තාවේ පෙන්වන පරිදි ණය හිමි ගිණුමට මාරු කිරීම 2011.06.29 දිනැති අංක 124/2011 ජර්නල සටහන මගින් කර ඇත.

### 2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

(අ) 2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රභවයේ දී රඳවාගත් බද්ද (WHT) රු. 918,960/- ක මුදල මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි ව පෙන්වා ඇති අතර උපලේඛන ඉදිරිපත් කිරීමේ දී රු. 48,941/- ක වෙනසක් නිරූපනය වන පරිදි දක්වා ඇත. එම වෙනස උපලේඛන පිළියෙල කිරීමේ ප්‍රමාද දෝෂයකින් සිදු වූවක් වන අතර නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ආ) මහපොල භාර අරමුදලට ගෙවියයුතු මුදල රු. 2,397,534/- ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. එය නිවැරදි වන අතර උපලේඛන පිළියෙල කිරීමේ දී වෙනසක් නිරූපනය වී ඇත. එය නිවැරදි කර ඇත.

### 2.2.4 ලැබියයුතු ගිණුම්

(අ) විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත්ව ගොස් ඇති හා මාරු වී ගොස් ඇති දැනට අර්ථසාධක අරමුදල් නිදහස් කර නැති සේවකයන්ගෙන් අයවිය යුතු කාර්ය මණ්ඩල ණය ශේෂ වශයෙන් මෙම මුදල් නියෝජනය වේ. මෙම සේවකයන් ණයමුදල් ලබා ගැනීමේ දී බැඳී ඇති ගිවිසුමට අනුව. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දී එම ණය මුදල් අය කර ගැනීමට ඉඩ ලැබේ. මේ අනුව එම මුදල් අර්ථ සාදක නිදහස් කිරීමේ දී අය කර කටයුතු කර ගනු ලැබේ. ස්ථාන මාරු ලැබූ සේවකයන්ගෙන් අයවිය යුතු මුදල් 2011 වර්ෂය තුල සම්පූර්ණයෙන් ම අයකර ගෙන ඇත.

(ආ) විශ්වවිද්‍යාලය විසින් බාහිර පුද්ගලයන්ට ගෙවිය යුතු ව පවතින විවිධ සේවාවල් ලබා ගැනීම වෙනුවෙන් ගිණුම් පිළියෙල කරන දිනට වූ ගෙවියුතු ශේෂයන් ණය හිමියන් වශයෙන් දක්වා ඇති අතර එම ගෙවිය යුතු මුදල් 2011 වර්ෂයේ මුල් කාර්තුව තුල ගෙවීම් කිරීම තුලින් ගිණුම් නිරවුල් වී ඇත. ගිණුම් වාර්ථා විගණකාධිපති වෙතට ඉදිරිපත් කල යුතු දිනය වන විටත් ශේෂ නිරවුල්ව තිබුණි. ඒ අනුව ශේෂ සනාථ කිරීමේ අවශ්‍යතාවයක් ණයහිමි ගිණුම සම්බන්ධයෙන් අවශ්‍ය නොවිය. කෙසේ නමුත් පැරණි ශේෂයන් සම්බන්ධයෙන් සනාථ කිරීමට කටයුතු කර ඇති අතර කාල විශ්ලේෂණද 2011 වර්ෂයේ ගිණුම් තුලින් කටයුතු කරනු ලැබේ.

(ඇ) පශ්චාත් උපාධි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ විවිධ අධ්‍යන කාර්යන් සදහා ලබා දිය යුතු අත්තිකාරම් මුදල් සියල්ලම 2011 වර්ෂය තුල පියවීමට කටයුතු කර ඇත.

(ඈ) 2010 දෙසැම්බර් 31 දිනට නොපියවා තිබූ පර්යේෂණ අත්තිකාරම් 2011 වර්ෂයේ දී පියවීමට කටයුතු කර ඇත.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීමේ කටයුතු පරිගණක ජාල තුලින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. දැනට පරිගණක ජාලයක් ලබා ගෙන ඇති අතර සියළු ස්ථාවර වත්කම් සත්‍යාපනය කර දත්ත රැස් කරවම්. තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට භාර දී ඇත. එම කටයුතු ද අවසන් කරමින් පවතී. එම කාර්යන්ගේ අවසාන ඵලය අදියර වශයෙන් රැස් කර ඇති දත්ත පරිගණක ජාලය වෙත ඇතුලත් කර ගැනීම ඉදිරි මාස දෙක තුල සිදුවනු ඇත.මේ අනුව 2011 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීම සමඟ ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබේ. PGDM අත්තිකාරම් උපලේඛන ජනල් සටහන් විස්තරාත්මක උපලේඛන හා විගණන පරීක්ෂාවට අවශ්‍ය වන පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.6 නීති. රීති . රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූලනොවීම.

(අ) 2010 වර්ෂය තුල ස්ථාවර වත්කම් සමීක්ෂණ කර ඇත. 2011 වර්ෂයට ස්ථාවර වත්කම් සමීක්ෂණ කිරීමට කටයුතු කරනු ලැබේ. එම වාර්ථා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) (i). විශ්ව විද්‍යාලයේ කුලී පදනම මත ලබා ගෙන ඇති වෛද්‍ය පීඨ කාර්ය මණ්ඩලය සඳහා ලබා දී ඇති නිවසේ පදිංචි කාර්ය මණ්ඩල වලින් මාසිකව එක් පදිංචි කරුවෙකු ගෙන් රු.1000.00 ක කුලී මුදලක් හා විදුලි ජල ගාස්තු වශයෙන් රු.300.00 ක මුදලක් 2011 සැප්තැම්බර් මස සිට අය කිරීමට කටයුතු කර ඇත.

උපකුලපති සඳහා ලබාගෙන දී ඇති නිවාස වෙනුවෙන් විශ්ව විද්‍යාල පද්ධතිය තුලම උපකුලපතිවරුන්ගෙන් නිවාස කුලී මුදල් අය කරනු නොලැබේ.

(ii). I ඉහත අංක (i) හි සඳහන් නිවාස වල පදිංචි කරුවන්ගේ මාසිකව ජල හා විදුලි වශයෙන් 2011 සැප්තැම්බර් මස සිට අය කිරීම් කටයුතු කර ඇත. උපකුලපති නිවාස වෙනුවෙන් සමස්ථ විශ්ව විද්‍යාල පද්ධතිය තුල ක්‍රියාත්මක වන පරිදි රජරට විශ්ව විද්‍යාලය තුලද ක්‍රියාත්මක කර ඇත.

II රජරට විශ්ව විද්‍යාලයේ රඹෑව හා මිහින්තලා පරිශ්‍රයේ පිහිටි පවුල් ඒකක නිවාස වල ගෙවල් කුලී. ජල බිල්පත් සංශෝධනය කිරීම සඳහා කටයුතු යොදා ඇත. පරිභෝජනය කරන ලද ජල ගාස්තු නිවාස පදිංචිකරුවන් ගෙවිය යුතු බව විශ්ව විද්‍යාලය පිළිගනී.

(ඇ) **(i)** රීති 395 (අ)

<u>ලංකා බැංකුව ජංගම ගිණුම් අංක 8586758,</u> 6809656 හා 5022209-

මෙම ජංගම ගිණුම් කීපයක් වර්ෂයේ අඛණ්ඩව මාස කීපයක අරමුදල් ලැබීම හෝ ගෙවීම සිදුව නැත. බැංකු ශේෂ හි මුදල් පොතේ ශේෂය ඒකාකාරිව තිබී ඇත. මේ අනුව බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දී බැහැර වී ඇති අතර 2010.12.31 දිනට බැංකු සැසඳුම් පිළියෙල කර ශේෂ නිවැරදිතාවය තහවුරු කර ඇත. බැංකු ශේෂ සහාතන ලිපි ද ලැබී ඇත. කෙසේ නමුත් විගණන වාර්තාවෙන් පෙන්වා ඇති පරිදි ගිනුම ක්‍රියාත්මක වී නැති මාස වෙනුවෙන් ද බැංකු සැසඳුම් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) මු .රෙ. 880

ඇප ~~ආයතන සංග්‍රහය~~ අනුව කටයුතු කිරීම පිළිබඳව උපදෙස් ලබා ගැනීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) <u>චක්‍රලේඛ</u>

කුලී මුදල් අය කරනු ලබන ගෙවල් කුලී නැවත සංශෝධනය කිරීම සඳහා 2011 වර්ෂය තුල කටයුතු කරනු ලැබේ.

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි සේවක පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර (Finger Prints Mechines) භාවිතා කිරීම සඳහා කටයුතු යොදා ඇත.

2.2.7 <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු</u>

(අ) (ආ)

සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතිය ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අනුව එය ක්‍රියාත්මක වනු ඇත. විගණන වාර්තාවේ දක්වා ඇති කරුනු පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් වී ඇත.

(ඇ) විශ්වවිද්‍යාලයට රජයෙන් පවරා දෙනු ලැබූ භූමිය තුල පිහිටි පොලිස් නිවාස පවරා ගැනීමේ කටයුතු විශ්වවිද්‍යාලය ආරම්භ කිරිමත් සමග සිදුව ඇති අතර එහෙත් රටේ පැවතුන ත්‍රස්තවාදී ක්‍රියාකාරිත්වයන් නිසා පොලිස් දෙපාර්තමේන්තුව විසින් එම නිවාස විශ්වවිද්‍යාලයට ලබා දීම ප්‍රමාද කර ඇත. එහෙත් 2006 වර්ෂය තුල පොලිස් දෙපාර්තමේන්තුව සමග

ඒකගතාවයකට පැමිණ ඇති අතර පොලිස් දෙපාර්තමේන්තුවට ගෙවීම සඳහා අරමුදල් නිදහස් කර ඇතත් එම දිනවල ඇති වූ ත්‍රස්තවාදී කටයුතු වල ප්‍රතිඵලයක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුවේ එම නිවාස ලබාදීම වෙනුවෙන් වූ ඒකගතාවය ප්‍රමාද කරන්නට යෙදුනි. ඒ අනුව භාණ්ඩාගාරයෙන් නිදහස් කර ඇති මුදල ලංකා බැංකුවේ දින 07 කට. මාස 03 කට වශයෙන් වූ ස්ථිර තන්පතු වල රඳවා තිබුණි. ඒ සඳහා පාලක සභාවේ ඒකගත්වය ලැබී තිබුණි. එහෙත් එම කාර්යය 2010 වන විටත් නිරවුල් වී නොතිබුණි.

2010 වර්ෂය තුල විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘති ගණනාවක් සිදුවෙමින් පැවැති අතර ශිෂ්‍යනේවාසිකාගාරයක කටයුතු අවසන් කිරීම වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා ගැනීම දුෂ්කර විය. ඒ සඳහා විශ්වවිද්‍යාල පාලක සභාවේ ඒකගත්වය මත ලංකා බැංකුවේ ස්ථිර තැන්පතුව මුදල් කර. ශිෂ්‍ය නේවාසිකාගාරවල ඉදිකිරීම් කටයුතු නිම කිරීම වෙනුවෙන් රු මිලියන 18 ක් හා ඒ සඳහා එකතුවී තිබූ පොලිය වන රු 8,473,673/= ක මුදල යොදා ගන්නා ලදී. එහෙත් 2010 දෙසැම්බර් මස අවසන් භාගය තුල භාණ්ඩාගරයෙන් ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා අරමුදල් නිදහස් කිරීමත් සමගම පොලිස් නිවාස පවරා ගැනීම වෙනුවෙන් තිබූ ස්ථිර තැන්පතු මුදල නැවත ඒ සඳහා යොදන ලදී. පොලී මුදල් ද සමග මුලු මුදල නැවත ස්ථාවර තැන්පතුවක යෙදීමට අරමුදල් ප්‍රමාණවත් නොවූ බැවින් එම අරමුදලට බැර නොකරන ලදී. එහෙත් 2011 වර්ෂය තුල පොලිස් දෙපාර්තමේන්තුව සමග ඒකගතාවයකට පැමිණ. එකී නිවාස පවරා ගැනීම වෙනුවෙන් භාණ්ඩාගරයෙන් නිදහස් කර ඇති මුදල කොටස් ගෙවීමක් වශයෙන් කිරීමට ඒකගතාවයකට පාලක සභාව පැමිණ ඇත. ඒ අනුව පොලී මුදල ද ඒ සඳහා යොදා ගන්නා ලෙස විගණන වාර්තාවෙන් ප්‍රකාශ කර ඇති බැවින් එම පොලී මුදල ද ඒ වෙනුවෙන් යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ .

## 03. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>
3.1.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

} සංශෝධිත සහිතව පිළිගනී.

3.1.3 <u>ඉතාලෝදයට තුඩු දෙන ගනුදෙනු</u>

රජරට විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය ශිෂ්‍යයින් සායන්ක කටයුතු සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා මාතලේ රෝහලේ පහසුකම් ඉල්ලා සිටි අතර එම රෝහලින් ඒ සඳහා ඉඩකඩ ලබා දෙන ලදී. එහෙත් එම සායන්ක කටයුතු සඳහා සහභාගි වන වෛද්‍ය ශිෂ්‍යයින්ගේ වෙනුවෙන් වැසිකිළි පද්ධතිය හා විවේකාගාරයක් අළුත් වැඩියා කිරීමට සිදුවිය. එබැවින් ඒ සඳහා රජරට විශ්ව විද්‍යාලයට ලැබී ඇති දූපාරුත්තාපන පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ අර මුදල් ලබා ගන්නා ලද අතර සායනික කටයුතු දැනටමත් එහි කරගෙන යනු ලැබේ. එම වියදම විශ්ව විද්‍යාලයේ පුනරාවර්තිත වියදමක් ලෙස සළකා කටයුතු කර ඇත.

### 3.2 <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.2 .1 <u>කාර්ය සාධනය</u>

(අ)
(ආ) } සංශෝධිත සහිතව පිළිගනු ලැබේ.
(ඇ)
(ඈ)

### 3.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

(අ) ඉදිකිරීමට යෝජිතව තිබූ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2007 වර්ෂය තුළ ලැබී තිබුණි.ඒ සඳහා වූ උපදේශක කටයුතු පවරා තිබුනේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවටය. 2007 වර්ෂය තුළ උපදේශණ කටයුතු සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලැබී තිබූ ප්‍රතිපාදන වලින් ගෙවීම් කරන ලදී. එහෙත් භාණ්ඩාගාරයෙන් ඉදිකිරීම් සඳහා අරමුදල් ලබා නොදීම හේතුවෙන් 2008. 2009. 2010 කාලය තුළ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වන්නට විය. එහෙත් 2011 වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබී තිබූ අතර එහි ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉදපිනේරු සංස්ථාවට පවරා ඇති අතර දැනට එහි ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී.

(ආ) රජරට විශ්ව විද්‍යාලයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කටයුතු 2008 වර්ෂය තුළ ආරම්භ කර ඇත. එම කටයුතු පවරා දී තිබූ කොන්ත්‍රාත් කරු ඉදිකිරීම් කටයුතු අතහැර යාමත් නිසා මෙම කටයුත්ත ප්‍රමාද වන්නට විය. 2010 වර්ෂය තුළ ප්‍රමානවත් ප්‍රතිපාදන නොතිබූ බැවින් 2010 වර්ෂය තුළ ද එම කටයුත්ත නිම කිරීමට නොහැකි විය. 2011 වර්ෂය තුළ එම ඉදිකිරීම නිම කිරීම සඳහා කටයුතු කර ඇත.

### 3.2.3 මූල්‍ය කළමනාකරණ අකාර්යක්ෂමතා

විශ්වවිද්‍යාලයේ පොදු අරමුදල සඳහා ලැබෙන අරමුදල් හා වියදම් පාලනයේ පහසුව වෙනුවෙන් බැංකු ජංගම ගිණුම් 16 ක් පවත්වාගෙන ගොස් ඇත. එක් එක් බැංකු ගිණුමේ මුදල් ඌණශාවය ඇති වූ අවස්ථාවල මාරු කිරීමේ බලය බැංකුවට ලබා දී ඇත. 2010.12.31 දින වන විට විශ්වවිද්‍යාලයේ සමස්ථ පොදු අරමුදලේ බැංකු මුදල් ශේෂය රු. ද .ල 20 කට ආසන්න වේ . එහෙත් විගණන වර්තාවෙන් දක්වන පරිදි වර්ෂය තුළ දී එක් එක් බැංකු ගිණුම් වල ඌණතාවය මාසයකට සීමාවන පරිදි සිදුව ඇත. එහෙත් ලංකා බැංකු පුනරාවර්තන අරමුදල් බැංකු ගිණුමේ භාණ්ඩාගාර චෙක් පත් ලැබීමේ ප්‍රමාදය මත මාස කිපයක් තුළ සිදුව ඇතත් දෙසැම්බර් මස 31 දින වන විට සම්පූර්ණයෙන් මගහැරී ඇත. විශ්වවිද්‍යාල පොදු අරමුදලේ වර්ෂයේ කිසිඳු දිනක මුදල් ඌනතාවයක් ඇති වී නැත කෙසේ නමුත් මෙම තත්වයන් වලක්වා ගැනීමට 2011 වර්ෂයේ දි කටයුතු කෙරේ.

(ආ) අධ්‍යයන කටයුතු වෙනුවෙන් යොදාගන්නා බාහිර කථිකාචාර්වරුන් විශ්වවිද්‍යාලයට පැමිණීම සඳහා ඔවුන් පෞද්ගලික වාහන යොදා ගන්නවා ඇත. ඔවුන් විසින් තම පෞද්ගලික වාහන යොදා ගත් බව ලිඛිතව ප්‍රකාශ කර ඇති අතර එම ප්‍රකාශ අධ්‍යන අංශ ප්‍රධානීන් හා පීඨාධිපතීන් තහවුරු කර ඇත. ඒ අනුව ගමන් වියදම් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. එම ක්‍රියාවලියෙන් බැහැරව වාහන පැමිණි බවට වෙනත් තහවුරු කිරීමේ ක්‍රමයක් විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කිරීමට විශ්ව විද්‍යාලයේ පීඨ දෙපාර්තමේන්තු ස්ථානගතවීමේ ක්‍රියාවලිය තුළ ප්‍රායෝගිකව නොහැකිවේ.

### 3.2.4 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

(අ) නිෂ්ක්‍රියව පවතින බැංකු ගිණුම් සක්‍රිය කිරීමට 2011 වර්පය තුළ කටයුතු කර ඇත.

(ආ) විශ්වවිද්‍යාල ස්ථාවර වත්කම් වලින් ඉවත් කළයුතුව පවතින භාවිතයෙන් තොරව ඇති වත්කම් චක්‍රලේඛ ප්‍රකාර ටෙන්ඩර් පරිපාටියට අනුව වෙන්දේසි කර විකිණීමට 2011 වර්ෂයේ දි කටයුතු කර ඇත.

(ඇ) වේලා සටහන් යන්ත්‍ර (Finger Print Machines) මිළදී ගැනීමත් සමග පැරණි යන්ත්‍ර ඉවත් කිරීමට කටයුතු කෙරේ.

**3.5** <u>හානි හා පාඩු</u>

2010 වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන අරමුදල් නිදහස් කර ගැනීමේදී මූල්‍ය දුෂ්කරතා ඇති විය. එහෙත් වැටුප් ගෙවීම නියමිත දිනට කළයුතු බැවින් ගෙවිය යුතු ශුද්ධ වැටුපට පමණක් භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබීම මත සේවක භාරකාර අරමුදල් චෙක්පත් යැවීම ප්‍රමාද විය. ඒ අනුව ප්‍රමාද වී සේවක භාරකාර අරමුදල් ගෙවීම හේතුවෙන් දින 15 කට රු. 14,064/- ක් අධිභාර මුදල් වශයෙන් අය කර ඇත. මෙය විශ්වවිද්‍යාලයට කරුණු පැහැදිලි කර අනුමැතිය ලබා අධිභාර ගෙවා නිදහස් කර ඇත. මෙම තත්වය දැනට සම්පූර්ණයෙන් මගහැරී ගොස් ඇත.

**3.2.6** <u>මානව සම්පත් කළමනාකරණය</u>

2011 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ තනතුරු පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර ඇත. එහෙත් මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු පුරවා ගැනීමට දුෂ්කර වී ඇත. ඒ වෙනුවෙන් වෙනත් විශ්වවිද්‍යාල වල මහාචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරුන්ගේ සේවය සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් කාර්ය මණ්ඩල වලින් ලබාගෙන ඇත.

**2.** <u>පද්ධති හා පාලන.</u>

අ. ආ. ඇ- ගිණුම්, ගබඩා, ස්ථාවර වත්කම් පද්දති හා පාලන.

කළමනාකරණය සඳහා මුදල් කමිටුව, විගණන හා කළමනාකරණ කමිටුව, සැපයුම් කමිටුව පත් කර ඇති අතර මාසිකව මුදල් හා සැපයුම් කමිටුව රැස්වේ. කළමනාකරණ හා විගණන කමිටුව මාස 02 කට වරක් රැස් වෙන අතර ඒ මගින් අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය අභ්‍යන්තර විගණන කටයුතු විගණකාධිපති පෙන්වා දෙනු ලබන කළමනාකරණ දුර්වල හා මගහරවා ගැනීම පාලන විධි අනුගමනය කරනු ලැබේ.

( මහාචාර්ය කේ. ඒ. නන්දසේන )

උපකුලපති.

මහාචාර්ය කේ.ඒ. නන්දසේන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.